# දනයේ ආනිසංස
## (දීමේ බල මහිමය)

ඩී.බී. කුරුප්පු ගේ කෘතිය පිළිබඳව කෙටි සටහනකි

රසික සූරියආරච්චි විසිනි

මීට දශයකටත් වඩා ඉහත දිනයකදී සිනමා පටයක් නැරඹීම සඳහා අපට ටිකට් පත් දෙකක් ලැබුණි. ජනප්‍රිය හොලිවුඩ් නළුවෙකු වන කෙවින් ස්පේසි පාසල් ගුරුවරයෙකු ලෙස රඟපෑ, -පේ-ඉට්-ෆෝවර්ඩ්" නම් වූ එහි කතාව ගොඩ නැගී තිබුනේ එතෙක් මා අසා නොතිබුණු අපූරු සිද්ධාන්තයක් පදනම් කර ගෙනය.

අපේ ජීවිත කාලය තුල විවිධ පුද්ගලයින් ගෙන් අපට විවිධාකාරයේ උදව් උපකාර ලැබේ. එවැනි සමහර උදව් උපකාර අපට අතීතයේ දී නොලැබුනේ නම් සමහර විට අපේ ජීවිත මීට වඩා හාත්පසින්ම වෙනස් වී වඩාත් දුක්බර වන්නටද ඉඩ තිබුණි. අප සමාජයේ මෙවැනි උදව් උපකාර සම්බන්ධයෙන් පිළිගත් මතය වන්නේ එසේ අපට උදව් කළ අයට හැකි සෑම විටකම ප්‍රතිඋපකාර කළ යුතු බවයි. එසේ නොකර සිටීම කෙලෙහි ගුණ නොදන්නා කමක් ලෙස සැලකේ.

"පේ-ඉට්-ෆෝවර්ඩ්" චිත්‍රපටියෙන් ඉස්මතු කර පෙන්වූ ඉහත ප්‍රතිඋපකාර කිරීමට වෛකල්පික මතය නම් යමෙකුගෙන් උදව්වක් උපකාරයක් ගත් අප කළ යුත්තේ, එවැනි උදව්වක් උපකාරයක් වෙනත් අයට ද කිරීම බවයි. එයින් සැමට උදව් උපකාර කරන ගුණෝත්තරව ප්‍රසාරණය වන සුවිශාල ජාලයක් ඇතිවේ. මුළු සමාජයම එකිනෙකාට උදව්කරන්නා එකක් වේ.

විශේෂයෙන්ම විදේශ රටක වාසය කරන අපට ඇති එක් නොවැලැක්විය හැකි කණගාටුවක් නම් ලංකාවේ වෙසෙන අපේ දෙමව්පියන් එදා අප කුඩා කල අපට කළ උදව් උපකාරවලට කෙසේ නම් ප්‍රතිඋපකාර කරන්නද, එසේත් නැත්නම්, දෙමව්පියන්ට ඇති ඒ ණය කෙලෙස ගෙවන්නද යන්නයි. "පේ-ඉට්-ෆෝවර්ඩ්" සිනමා පටිය නැරඹීමෙන් පසුව මට වැටහුනේ අපට අපේ දෙමව්පියන් වෙනුවෙන් කළ හැකි හොඳම කළගුණ සැලකීම නම් අපේ දරුවන්ට හොඳ දෙමව්පියන් වීම බවයි!
අප කරන්නේ "පේ-බැක්" ද, "පේ-ෆෝවර්ඩ්" ද යන්න කෙසේ වෙතත්, වෙනත් අයෙකුට අඩුතරමේ වචනයකින් හෝ සිනාවකින් හෝ උදව්වක් උපකාරයක් කළ හැකි නම් එය ඉතා වටිනා මානුශීය ක්‍රියාවක් බව ආගමික පසුබිමක් නොමැති කෙනෙකුට වුවද එකඟ විය හැකි කරුණකි. ඕස්ට්‍රේලියානු වාසී




කෘතහස්ත ලේඛක ඩී.බී. කුරුප්පු විසින් රචිත නවතම කෘතිය වන දනයේ ආනිසංස (දීමේ බල මහිමය), මේ බව මනාව සාධනය කර පෙන්වන්නකි. උවැසියක් බුදුන්ට ආහාර පූජා කරන කංචුකයකින් මේ කෘතිය සැරසී තිබුණද, එහි අන්තර්ගතයේ සුවිශේෂීව බුද්ධාගමට පමණක් වෙන් වූ සිද්ධාන්තයක් අඩංගු නොවන බව කිව මනාය.

දනය හෙවත් දීම පිළිබඳව සහ ඒ හා අදල විවිධ මාතෘකා යටතේ ලියවී එකට ඈඳුණු කුඩා පරිච්ඡේද විසි පහකින් සමන්විත මේ කෘතිය සඳහා ඩී.බී. කුරුප්පු මුලිකව පාදක කරගෙන ඇත්තේ ඇමරිකන් ජාතික අසීම් ජමාල් සහ හාවේ මැකිනොන් විසින් රචිත "ද පවර් ඔෆ් ගිවින්" නම් වූ කෘතියයි. එසේ වතුදු මේ කෘතියේ එන විවිධ කරුණු සනාථ කිරීම සඳහා දශක ගණනාවක් පුරා ශ්‍රී ලංකාව, එංගලන්තය සහ ඕස්ට්‍රේලියාව වැනි රටවල දී තමා ලබා ඇති අත්දැකීම් සහ විවිධ අදහස්, ඔහු ගේ අනෙකුත් කෘති සහ ලිපිවල අප කියවා ඇති සුවිශේෂී ආකාරයටම ඩී. බී. උපයෝගී කොට ගෙන ඇති හෙයින් මෙය හුදු පරිවර්තනයකට වඩා බෙහෙවින්ම ස්වායත්ත වූ කෘතියක් ලෙස සැලකිය යුතුය.

දනය හෙවත් දීම යනුවෙන් සැමවිටම අදහස් වන්නේ යම් කිසි භෞතික වස්තුවක් පරිත්‍යාග කිරීම ම නොවේ. එසේම දීම යනු පින් තකා කෙරෙන කටයුත්තක් විය යුතුම නැත. මේ සරල කරුණු කිහිපය අවබෝධ කර ගත් විට දනය යන්න අපේ එදිනෙද ජීවිතයට කෙතරම් ලේසියෙන් සම්බන්ධකරගත හැකිද යන්නත්, එයින් පුද්ගලිකව අපටත්, පොදුවේ අප වෙසෙන සමාජයටත් කොයි ආකාරයේ ධනාත්මක බලපෑමක් කළ හැකිද යන්නත් මනාව පැහැදිලි වෙයි.

වරෙක සිතට හාස්‍යය ගෙන දෙන, වරෙක සිත සසල කරවන, වරෙක සිත හැඟුම් බර කරවන විවිධ උදහරණ සහිතව, පහසුවෙන් කියවිය හැකි ඩී.බී. කුරුප්පු ගේ සරල සුමට භාෂා ශෛලියෙන් ලියවී අනාකූලව ගලා යන මේ වැදගත් කෘතිය කියවීමෙන් අප සැම දෙනෙකුටම පාහේ අළුතින් හිතන්නට යමක් ලැබෙන බව ඉඳුරාම කිව හැකිය.

මේ පොත කියවන තැනැත්තෙක් එයින් යමක් උකහා ගත්තොත් ඉන් පසු කළ යුත්තේ එය සම්පාදනය කළ ඩී.පී. කුරුප්පු ට ස්තුතිවන්න වීමට වඩා, ඒ තමා අවබෝධකරගත් කාරණය තව අයෙකුටත් වටහා ගැනීමට ඉඩ ලබාදීම පිණිස පොත තවත් පිරිසක් අතර සංසරණය කිරීම බව අවසාන වශයෙන් පවසමි.

පෙර කී "පේ-ඉට්-ෆෝවර්ඩ්" සිනමා පටය නැරඹීමෙන් අනතුරුව -පිය සමර" නමින් කවි පන්තියක් ලියා මා කලේ ද, අද මෙම කෙටි සටහන ලිවීම තුලින් මා සිදු කරන්නේද එවැනි ම වූ ක්‍රියාවන් ය.

ආචාර්ය පාලිත ගනේවත්ත ලියන ඩීබී ගේ සාහිත්‍ය සේවාව ලිපිය නොවැළැක්විය හැකි හේතු මත මෙවර පළ නොවන බව කරුණාවෙන් සළකන්න




පැතිකඩ


ආචාර්ය පාලිත ගනේවත්ත





Staying at Ethara residencies is similar to having your own little holiday home in the heart of Rajagiriya, Colombo. Tucked in amongst nature away from the busy City, you'll have peace, privacy and space. Ethara residency is found in our own three story house where you have the whole top floor to yourself. For US $75 per night you will have:

- A highly secure holiday home for families with children or a group of friends under the care of our resident manager.
- 3 large bedrooms - 4 to 5 people can sleep, two bathrooms with hot water, Tea/coffee making facility, veranda, large balcony with nice view and lots of natural air and light.
- Gas Stations, Banks, Post Office, Cargils and Keells super markets, KFC, Pizza Hut, McDonald's, Perera & Sons, Barista and many other restaurants within easy access.
- 2 TVs and a selection of English novels for your entertainment.

**Please email dates of your stay to**
**ethararesidencies@hotmail.com**
**to book this great family holiday home.**

**For more details contact**
**Shiroma on +9411 286 9518, +9477 220 2100 or**
**Call Uditha in Australia on +61422 672 484**




**BMJ TOURS**

- Snow Trips
- Airport Transfers (Pick up and drop off)
- Interstate Tours
- Local Tours
- 24 hours 7 days a week
- 24, 12, 8 Seated Vehicles

**Air Conditioned, Safety Seatbelts**

**Sorrento Ferry**
Ballarat
Sovereign Hill

**Snow Areas**
Mt Hotham, Mt Buffalo,
Mt Buller, Mt Baw Baw

**Great Ocean Road**
Sorrento Ferry
The 12 Apostles

**Lake Entrance**
Buchan Caves

**Philip Island**
Penguin Parade,
The Nobbies, Wildlife Park

Accreditation (S001929) Department of Infrastructure Hazardous Area Authority (Alpine)

**Cooray**
Tel- 85028580
Mob- 0421741244
- 0401369218